# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2116/59 - 2019 මාර්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2019.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන පහත දැක්වෙන ඉඩම්/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර*

ගාල්ල දිස්ත්‍රික්කයේ, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොබෙයිතුඩුව ගමේ පිහිටි, ගාල්ල මැනුම්පති විසින් මැන සකස් කරන ලද 2018-02-17 දිනැති මූලික පිඹුරු අංක ගා/4306 දරන සැලැස්මේ කැබලි අංක 01 වශයෙන් විස්තර කෙරෙන පාත්‍රකැටියවත්ත සහ ගොරකගහකුඹුර නැමැති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.0530 ක් වූ ඉඩම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්/අයිතිවාසිකම් හෝ වෙනත් අයිතිවාසිකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2019.06.06 වැනි දින පෙ. ව. 10.00 ට අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි

තවද 2019.05.23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. ඉඩම් වල තම අයිතිය තහවුරු කිරීම සඳහා අදාළ ඔප්පු සහ ලිපි ලේඛන පරීක්ෂණ දිනයේදී රැගෙන ආ යුතුයි.

එච්. කේ. සරසි. එස්. ගුණසේකර,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්ගොඩ.

2019 මාර්තු මස 06 දින,
අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දී ය.

04-401




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.